# 1985 අගෝස්තු - රසායන විද්‍යාව

## I කොටස

1. පරමාණුව යන පදය ප්‍රථමයෙන් හඳුන්වා දෙන ලද්දේ පහත සඳහන් කවුරුන් විසින්ද?
(1) කැනිසාරෝ (2) ඩෝල්ටන් (3) ඩෙබරයිනර්
(4) ඇවොගැඩ්‍රෝ (5) මෙන්ඩලිෆ්

2. ජලය ග්‍රෑම් 180 ක අන්තර්ගත ජල අණු සංඛ්‍යාව වනුයේ
(1) 10 කි (2) $6.023 \times 10^{23}$ ය. (3) $6.023 \times 10^{23}$ කි.
(4) $6.023 \times 10^{24}$ කි (5) $10^4$ කි.

3. සල්පර් ග්‍රෑම් 32 ක අන්තර්ගත $S_8$ මවුල සංඛ්‍යාව වනුයේ
(1) 4 ය (2) $\frac{6.023 \times 10^{23}}{8}$ ය (3) $\frac{1}{8}$ ය.
(4) 1ය (5) $\frac{1}{4}$ ය.

4. බෙන්සීන් ($C_6H_6$) ග්‍රෑම් 0.78 ක් සම්පූර්ණයෙන් දවාලීමට, සෙන්ටිග්‍රේඩ් අංශක 0 දී සහ රසදිය මිලි මීටර 760 ක පීඩනයක දී අවශ්‍ය ඔක්සිජන් පරිමාව වනුයේ ඝන ඩෙසිමීටර (ලීටර)
(1) 17.47 කි (2) 2.24 කි. (3) 1.68 කි.
(4) 1.75 කි (5) 16.80 කි.

5. පිටතම කවචයේ එක් ඉලෙක්ට්‍රෝනයක් පමණක් ඇති මූල ද්‍රව්‍යයකි.
(1) Cd (2) Cr (3) Al (4) Mg (5) Cl

6. $Li^+$, $Be^{2+}$ සහ $Mg^{2+}$ යන අයනවල අරයන්ගේ විචලනය පහත දැක්වෙන කවරක්ද?
(1) $Li^+ < Be^{2+} < Mg^{2+}$ (2) $Be^{2+} < Li^+ < Mg^{2+}$ (3) $Mg^{2+} < Be^{2+} < Li^+$
(4) $Li^+ < Mg^{2+} < Be^{2+}$ (5) $Mg^{2+} < Li^+ < Be^{2+}$

7. න්‍යෂ්ටියේ ස්ථායිතාව අධිකම වන්නේ පහත සඳහන් කුමන සමස්ථානිකයේද?
(1) $^{6}_{3}Li$ (2) $^{9}_{4}Be$ (3) $^{10}_{5}B$ (4) $^{24}_{12}Mg$ (5) $^{30}_{14}Si$

8. සාපේක්ෂ පරමාණුක ස්කන්ධය 30.0 ක් වූ A නම් මූල ද්‍රව්‍යයක් B නම් වෙනත් මූල ද්‍රව්‍යයක් සමග ප්‍රතික්‍රියාකර $AB_3$ නම් සංයෝගය සාදයි. A වල ග්‍රෑම් 1.50 ක් B වල ග්‍රෑම් 5.40 ක් සමග සම්බන්ධ වී නම්, B වල සාපේක්ෂ පරමාණුක ස්කන්ධය වනුයේ
(1) 32.4 ය. (2) 16.2 ය. (3) 10.8 ය.
(4) 108.0 ය. (5) 36.0 ය.

9. ශිෂ්‍යයෙක් වායු මිනුම් සරාවල හයිඩ්‍රජන් සහ ක්ලෝරීන් සම පරිමා එකතු කොට මිශ්‍රණය නියත පීඩනයක් යටතේ මද හිරුඑළියේ තැබීය. ඔහු උත්සාහ දරුවේ කුමන නියමය පරීක්ෂණාත්මකව ඔප්පු කිරීමටද?
(1) ගේ ලුසැක් නියමය (2) බොයිල් නියමය
(3) ස්ථිර සමානුපාත නියමය (4) ගුණානුපාත නියමය
(5) ස්කන්ධ සංස්ථිති නියමය.

10. එක්තරා උෂ්ණත්වයකදී AgCl වල ද්‍රාව්‍යතාව ජලයේ දී $S_0$ ද, ඝන ඩෙසිමීටරයට මවුල 0.01 $CaCl_2$ ද්‍රාවණයකදී $S_1$ ද, ඝන ඩෙසිමීටර මවුල 0.01 NaCl ද්‍රාවණයකදී $S_2$ ද, ඝන ඩෙසිමීටරයට මවුල 0.05 $AgNO_3$ ද්‍රාවණයකදී $S_3$ ද, ඝන ඩෙසිමීටරට මවුල 0.005 $AlCl_3$ ද්‍රාවණයකදී $S_4$ ද වේ. මෙම ප්‍රමාණයන් අතර කුමන සම්බන්ධතාව නිවැරදි වේද?
(1) $S_0 > S_3 > S_1 > S_2 > S_4$ (2) $S_0 > S_2 > S_4 > S_1 > S_3$
(3) $S_0 > S_3 > S_2 > S_1 > S_4$ (4) $S_0 > S_1 > S_2 > S_4 > S_3$
(5) $S_0 > S_4 > S_1 > S_2 > S_3$

11. $H_2S$ අණුවේ හැඩය
(1) රේඛීය වේ. (2) කෝණික වේ. (3) චතුස්තලීය වේ.
(4) ත්‍රිකෝණික වේ. (5) ඉහත සඳහන් එකක්වත් නොවේ.

12. $H_2S$ සහ $SO_2$ අතර ප්‍රතික්‍රියාවේදී $H_2S$ ක්‍රියා කරන්නේ
(1) ඔක්සිකාරකයක් ලෙසය. (2) ඔක්සිහාරකයක් ලෙසය.
(3) අම්ලයක් ලෙසය. (4) සල්ෆකාරකයක් ලෙසය.
(5) උත්ප්‍රේරකයක් ලෙසය.

13. ආම්ලික මාධ්‍යයේදී $K_2Cr_2O_7$ මගින් හයිඩ්‍රජන් සල්ෆයිඩ් ඔක්සිකරණය කිරීමේදී ක්‍රෝමියම් හි ඔක්සිකරණ අවස්ථාව වෙනස් වන්නේ,
(1) 7 සිට 2 දක්වාය (2) 3 සිට 6 දක්වාය. (3) 2 සිට 6 දක්වාය.
(4) 5 සිට 2 දක්වාය (5) 6 සිට 3 දක්වාය.

14. රත්කළ විට පහසුවෙන් ඔක්සිජන් පමණක් [illegible]
(1) $NaNO_3$ (2) $Pb(NO_3)_2$ (3) [illegible] (4) $AgNO_3$ (5) $Na_2O$

15. මින් කුමන ඔක්සයිඩය ජලීය ද්‍රාවණයේදී නයිට්‍රික් අම්ලය පමණක් ලබා දෙයිද?
(1) NO (2) $N_2O$ (3) $N_2O_3$ (4) $N_2O_5$ (5) $N_2O_4$

16. M නම් මූලද්‍රව්‍යය යුගල් නොවූ ඉලෙක්ට්‍රෝන තුනක් ඇති ස්ථායි $M^{3+}$ අයනය සාදයි. M පරමාණුවේ යුගල් නොවූ ඉලෙක්ට්‍රෝන හයක් ඇත M වූ කලී
(a) Al ය. (2) Cr ය. (3) Fe ය. (4) Co ය. (5) S ය.

17. $CH_3CH{=}CHCH_2COCH_3$ හි IUPAC නාමය කුමක්ද?
(1) හෙක්ස්-2-ඊන්-5-ඔන් (2) හෙක්ස්-4-ඊන්-2-ඔන්
(3) 5 ඔක්සො-හෙක්ස්-2-ඊන් (4) මෙතිල් බියුට් 2-ඊනයිල් කීටෝන්
(5) 2-ඔක්සො-හෙක්ස්-4-ඊන්

18. (a) $CH_3CO_2H$; (b) $CH_3OH$; (c) $C_6H_5OH$ සහ (d) $ClCH_2CO_2H$ යන මේවායේ ආම්ලිකතාව අඩුවන පිළිවෙල වනුයේ
(1) a>c>b>d (2) c>a>b>d (3) d>a>c>b (4) d>c>a>b (5) a>d>b>c

19. අණුක සූත්‍රය $C_4H_{11}N$ වූ ප්‍රකාශ සක්‍රිය නොවන ප්‍රාථමික ඇමීන කොපමණ සංඛ්‍යාවක් තිබිය හැකිද?
(1) සතරකි (2) තුනකි (3) හයකි (4) පහකි (5) දෙකකි.

20. නිර්ජලීය $AlCl_3$ ඇතිවිට, $CH_3CH_2COCl$, $C_6H_6$ සමග ප්‍රතික්‍රියා කොට ලබා දෙන්නේ
(1) $CH_3CH_2COC_6H_5$ ය (2) $C_6H_5Cl$ ය. (3) $CH_3CH_2CH(Cl)\text{-}C_6H_5$ ය.
(4) $CH_3CH_2CH(Cl)OC_6H_5$ ය. (5) ඉහත සඳහන් එකක්වත් නොවේ.

21. $CH_3CH_2CHO + C_6H_5MgBr \xrightarrow[(2)\ HCl]{(1)\ වියළි\ ඊතර්}$ ප්‍රතික්‍රියාවේ ඵලයේ ව්‍යුහය වනුයේ පහත දැක්වෙන කවරක්ද?
(1) $CH_3CH_2CH(C_6H_5)\text{-}OMgBr$ (2) $CH_3CH_2CH(C_6H_5)\text{-}OH$ (3) $CH_3CH_2C(C_6H_5){=}O$
(4) $CH_3CH(C_6H_5)CH_2OMgBr$ (5) $CH_3CH(C_6H_5)CH_2OH$

22. (a) $CH_3OH$ (b) $CH_3CH_3$ සහ (c) $CH_3CH_2OH$ යන සංයෝගවල තාපාංක වැඩිවන පිළිවෙල වනුයේ
(1) a<b<c (2) b<a<c (3) c<a<b (4) b<c<a (5) a<c<b

23. IUPAC ක්‍රමය අනුව නම් කරන ලද 2-හයිඩ්‍රොක්සි-4-මෙතිල් පෙන්ටැනැල්වල ව්‍යුහය කුමක්ද?
(1) $CH_3\text{-}CH_2\text{-}CH_2\text{-}CH(OH)\text{-}CHO$ (2) $CH_3\text{-}CH(CH_3)\text{-}CH_2\text{-}CH(OH)\text{-}CHO$
(3) $CH_3\text{-}CH(H)\text{-}CH_2\text{-}CH_2\text{-}CHO$ (4) $CH_3\text{-}CH(CH_3)\text{-}CH_2\text{-}C(=O)\text{-}CH_2OH$
(5) $CH_3\text{-}CH(OH)\text{-}CH_2\text{-}CH(CHO)\text{-}CH_3$

24. ජලීය NaOH සමග $CH_3\text{-}\overset{O}{\overset{\|}{C}}\text{-}OCH_2CH_3$ රත්කළ විට ලැබෙන ඵල වනුයේ
(1) $CH_3CO_2H + CH_3CH_2OH$ (2) $CH_3CO_2H + CH_3CH_2ONa$
(3) $CH_3CH_2CO_2Na + CH_3OH$ (4) $CH_3CO_2Na + CH_3CH_2OH$
(5) $CH_3CO_2Na + CH_3CH_2ONa$

25. කෙල්වින් අංශක 273.12 දී අයිස්, ජලය බවට හැරවීමේදී
(1) ක්‍රිය වලිය ස්වය සිද්ධ වේ (2) උෂ්ණත්වය ඉහළ නගී
(3) තාප හුවමාරුවක් නැත. (4) තාපය පිටවේ.
(5) තාපය උරාගනී

26. කොපර් ඉලෙක්ට්‍රෝඩ භාවිත කර කොපර් සල්ෆේට් ද්‍රාවණයක් විද්‍යුත් විච්ඡේදනය කිරීමේදී
(1) ඇනෝඩයේ බර වැඩි වේ. (2) කැතෝඩයේ බර අඩු වේ.
(3) විද්‍යුත් ධාරාව ද්‍රාවණය හරහා ඍණ අග්‍රයේ සිට ධන අග්‍රයට ගමන් කරයි.
(4) කොපර් සල්ෆේට් සාන්ද්‍රණය අඩු වේ.
(5) කොපර් සල්ෆේට් සාන්ද්‍රණය වෙනස් නොවේ.

ප්‍රශ්න අංක 27 සිට 30 දක්වා පහත දී ඇති රූප සම්බන්ධයෙන් වේ



(a) (b) (c) (d)

[illegible] ඩෙසිමීටරයට මවුල 0.1 ක් [illegible] භස්ම ද්‍රාවණයෙන්, ඝන සෙන්ටිමීටර 25.0 ක් අනුමාපන ප්ලාස්ක [illegible]

www.sinhalalibrary.com
Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

(1) සෘණ උත්ප්‍රේරක ක් පද්ධතියට එකතු කිරීමෙනි
(2) තවත් සත කාබන් එකතු කිරීමෙනි.
(3) තවත් හුමාලය එකතු කිරීමෙනි.
(4) පද්ධතියේ උෂ්ණත්වය ඉහළ දැමීමෙනි
(5) නිර්ජලීය $CaCl_2$ එකතු කිරීමෙනි.

56. කොබෝල්ට්වල සාපේක්ෂ පරමාණුක ස්කන්ධය නිකල් වල සාපේක්ෂ පරමාණුක ස්කන්ධයට වඩා වැඩි නමුත්, ආවර්තිතා වගුවේ නිකල්වලට ප්‍රථමයෙන් කොබෝල්ට් අන්තර්ගත කර ඇත. මය සඳහා ධාත්ම පිළිගත හැකි හේතුව කුමක්ද?
(1) මේවා ය සාපේක්ෂ පරමාණුක ස්කන්ධ දෝෂ සහගත ව නිර්ණය කර ඇත.
(2) කොබෝල්ට් සහ නිකල්වල පිළිවෙලින් ප්‍රෝටෝන 27 සහ 28 බැගින් ඇත.
(3) නිකල්වල ස්ථායී සමස්ථානිකවල පරමාණුක ස්කන්ධ කුඩාය
(4) මූලද්‍රව්‍ය දෙක ආවර්තිතා වගුවේ නිවැරදි කාණ්ඩවල අන්තර්ගත වේ.
(5) නිකල්වල ඇති නියුට්‍රෝන සංඛ්‍යාව කොබෝල්ට්වලට වඩා අඩු වේ.

57. ජෙරනියෝල් ප්‍රධාන සංඝටකය ලෙස පවතිනුයේ
(1) පැඟිරි තෙල්වල ය. (2) කුරුඳුකෙල්වල ය
(3) සාදික්කා තෙල්වල ය. (4) කරදමුංගුතෙල්ව ය
(5) කරාබුනැටි තෙල්වල ය.

58.



(1) (2) (3) (4) (5)

ඉහත දී ඇති සංයෝගවලින් කුමක් පහත දී ඇති නිරීක්ෂණ සියල්ලම දෙයිද?
a) ජලීය NaOH හි ද්‍රාව්‍ය වේ.
(b) කාමර උෂ්ණත්වයේ දී ජලීය NaOH සමග ඇමෝනියා පිට කරයි
(c) සෝඩා ලයිම් ආශ්‍රිතය උදාසීන $FeCl_3$ සමග දම් ව ර්ණයක් දෙයි

59. $CH_3C \equiv CH \xrightarrow[HgSO_4]{සා. H_2SO_4}$ ප්‍රතික්‍රියාවේ ඵලය වනුයේ පහත දැක්වෙන කවරක්ද?

(1) $CH_3CH = CHOH$ (2) $CH_3-\overset{O}{\overset{\|}{C}}-CH_3$ (3) $CH_3CH_2CHO$

(4) $CH_3\overset{OH}{C} = CH_2$ (5) $CH_3C \equiv C-Hg$

60. X නම් සංයෝගයක් පහත සඳහන් ගතිගුණ පෙන්වයි.
(a) 2,4 ඩයිනයිට්‍රොපීනයිල් හයිඩ්‍රසීන් සමග කහ අවක්ෂේපයක් සාදයි.
(b) ටොලන් ප්‍රතිකාරකය සමග ප්‍රතික්‍රියා නොකරයි.
(c) උදාසීන $FeCl_3$ සමග වර්ණයක් නොදේ
(d) NaOI සමග ප්‍රතික්‍රියා කොට අයඩොෆෝම් සාදයි.
X හි ව්‍යුහය විය හැකි වන්නේ පහත දැක්වෙන කවරක්ද?



(1) (2) (3) (4) (5)

## රසායන විද්‍යාව II
### "A" කොටස - ව්‍යුහගත රචනා

1. (a) A, B, C, D, E, F, G, H, I සහ J යනු පිළිවෙලින් Z, (Z+1)... (Z+9) යන පරමාණුක ක්‍රමාංක ඇති අන්තර්ක නොවන ආවර්තිතා වගුවේ අනුයාත මූලද්‍රව්‍ය දහයකි. එම මූල ද්‍රව්‍යවල පරමාණුක ක්‍රමාංක සමග පරමාණුක අරය විචලනය වන අයුරු පහත දක්වා ඇත.




i. ඒක සංයුජ අයනික හයිඩ්‍රයිඩ සාදන්නේ එම මූලද්‍රව්‍ය වලින් කුමන ඒවාද?
ii. ඉහළම ප්‍රථම අයනීකරණ ශක්තිය දක්වන්නේ කුමන මූලද්‍රව්‍යයද? ඔබේ තේරීම සඳහා හේතු දක්වන්න.
iii. C සහ G මූලද්‍රව්‍ය අතර සෑදෙන ස්ථායී සංයෝගයක සූත්‍රය දක්වන්න.
iv ඉහත මූලද්‍රව්‍ය දහයෙන් ඉතාමත්ම විද්‍යුත් සෘණ මූලද්‍රව්‍යය හඳුනා ගන්න.
v F නම් මූලද්‍රව්‍යය ආවර්තිතා වගුවේ කුමන කාණ්ඩයට අයත් වේදැයි අපෝහණය කරන්න. මෙම කාණ්ඩයේ ප්‍රථම මූලද්‍රව්‍ය දෙක සඳහා බහුරූපික ස්වභාවයන් දෙක බැගින් නම් කරන්න.

(b) A සිට G දක්වා මූලද්‍රව්‍යවල, පරමාණුක ක්‍රමාංකය අනුව ප්‍රථම අයනීකරණ ශක්තිය විචලනය වන ආකාරය දැක්වෙන සටහනක් අඳින්න. අයනීකරණ ශක්ති අගයන්ගේ සාපේක්ෂ විචලනය මිස නිවැරදි අගයන් දැක්වීම අපේක්ෂා නොකෙරේ.




2. (a) $Na_2CO_3.10H_2O$ සහ $NaHCO_3$ මිශ්‍රණයක බර නියත වන තෙක් රත් කරන ලදී. මිශ්‍රණයේ සම්පූර්ණ බර අඩුවීම ග්‍රෑම් 2.90 ක් වූ අතර එයින් ග්‍රෑම් 1.10 ක ප්‍රමාණයක් වියළි $CO_2$ විය. මුල් මිශ්‍රණයේ වූ $Na_2CO_3.10H_2O$ වල බර ගණනය කරන්න.

(b) පහත දී ඇති සංයෝග $H_2S$ සමග ඇති කරන ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණය බැගින් ලියන්න.
i. සා. $HNO_3$ ii. සා. $H_2SO_4$ iii $Cl_2$ දියර

(c) ගල් ගුහාවකින් ලබාගත් අඟුරු වූ දැව නිදර්ශකයක්, කාබන් ග්‍රෑමයකට මිනිත්තුවකට පරාවර්තන හයක විකිරණශීලතාවයක් දක්වයි. ජීවමාන ගසකින් ලබාගත් එම වර්ගයේම ලී නිදර්ශකයකින් කාබන් ග්‍රෑමයකට මිනිත්තුවකට පරාවර්තන විසි හතරක මූලික ක්ෂයවීමේ සීඝ්‍රතාවක් ලැබුණි. ගල් ගුහාවේ වාසය කළ අය කැබැල්ල දැවූයේ කොපමණ කලකට ඉහත දී දැයි නිර්ණය කරන්න [$^{14}C$ හි අර්ධ ජීව කාලය අවුරුදු 5600 ක් වේ.]

3. (a) i M නම් කාබනික සංයෝගයක් $C_4H_{12}O$ යන අනුභවික සූත්‍ර ඇති බව දක්වයි. උෂ්ණත්වය 227°C හිදී සහ සාමාන්‍ය වායුගෝල පීඩනයේදී සංයෝගයේ වාෂ්පයේ ඝනත්වය සහ වෙසිමීටරයට (ලීටරයට) ග්‍රෑම් 2.46 ක් වේ. M හි සත්‍ය අණුක සූත්‍රය ගණනය කරන්න.
ii M අයඩොෆෝම් පරීක්ෂණයට සහ බ්‍රේඩි (2,4-ඩයිනයිට්‍රොපීනයිල් හයිඩ්‍රසීන්) ප්‍රතිකාරකයට පිළිතුරු දේ නම් M සඳහා තිබිය හැකි ව්‍යුහයක් ලියන්න.

(b) පහත සඳහන් යුගල වලින් ඒ ඒ සංයෝග වෙන් කර හඳුනා ගැනීම පිණිස යෙදිය හැකි රසායනික පරීක්ෂණ එක බැගින් දෙන්න
i. n-හෙක්සයිල් ඇමීන් සහ ඇනිලීන් ii. ෆීනෝල් සහ බෙන්සොයික් ඇසිඩ්

(c) ප්‍රොපීන් කුමන තත්ත්ව යටතේ දී HBr සමග කෙසේ ප්‍රතික්‍රියා කරයිද?

4 (a) පහත සඳහන් දෑ එක් පියවරේ පරිවර්තන ලෙස ඔබ සිදු කරන්නේ කෙසේද? පරීක්ෂණ තත්ත්ව සහ භාවිත කළ ප්‍රතිකාරක දක්වන්න.




www.sinhalaelibrary.com
Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

(b) සාමාන්‍ය උෂ්ණත්වයේදී සා. $HNO_3$/ සා.$H_2SO_4$ මගින් බෙන්සීන් නයිට්‍රෝකරණය කිරීමේදී

i. බෙන්සීන් වලය සමග ප්‍රථමයෙන් ප්‍රතික්‍රියා කරන්නේ කුමක්ද?

ii. එය බෙන්සීන් වලය මත ක්‍රියාකාරිවීමෙන් ඇතිවන අන්තර් මාධ්‍යයේ ව්‍යුහය ලියන්න.

(c) පහත දැක්වෙන ප්‍රතික්‍රියාවලින් ඇතිවන ප්‍රධාන ඵලවල ඇති ව්‍යුහ අඳින්න.

i. 

ii. 

iii. $CH_3CH_2CH_2CONH_2 \xrightarrow{P_2O_5}$

iv. 

"ආ" කොටස - රචනා

5. (a) "උදාසීනීකරණ එන්තැල්පිය" යන්න පහදා දෙන්න.

(b) ප්‍රබල භස්ම මගින් ප්‍රබල අම්ල උදාසීනකරණයේ එන්තැල්පිය නියතයක් වේය යන නිරීක්ෂණය පහදා දෙන්න.

(c) භස්මයක් මගින් අම්ලයක් උදාසීනීකරණය කිරීමේ එන්තැල්පිය නිර්ණය කිරීම පිණිස ඔබ පරීක්ෂණාගාරයේදී සිදු කරන පරීක්ෂණයක් විස්තර කරන්න. වැදගත් පරීක්ෂණ විස්තර සියල්ල දෙන්න.

(d) ප්‍රබල භස්මයක් මගින් HCl මවුල 0.025 ක් සම්පූර්ණයෙන් උදාසීන කිරීමේදී කිලෝ ජූල් 1.425 ක තාප ප්‍රමාණයක් පිටවේ. ප්‍රබල භස්මයක් මගින්ම දුබල අම්ලයක මවුල 0.025 ක් උදාසීනකරණය කිරීමේදී පිටවූ තාප ප්‍රමාණය 1.375 kJ ක් විය. දුබල අම්ලය විඝටනය වීමේ එන්තැල්පිය ගණනය කරන්න.

(සැ.යු. ප්‍රතික්‍රියාවට ප්‍රථමයෙන් දුබල අම්ල විඝටනය විය යුතුය)

6. (a) පරිපූර්ණ වායුව යන පදය පහදු දෙන්න.

(b) සත්‍ය වායු පරිපූර්ණ වායු ලෙස හැසිරීමෙන් අපගමනය වන්නේ මන්ද?

(c) i. T නම් උෂ්ණත්වයක් ඇති වායු නිදර්ශකයක අණුවල වේග ව්‍යාප්තිය දැක්වෙන සටහනක් අඳින්න.

ii. T වලට වඩා ඉහළ උෂ්ණත්වයකදී එම වායු නිදර්ශකයේම අණුවල වේග ව්‍යාප්තිය දැක්වෙන සටහනක් තිත්-ඉරක් මගින් ඉහත රූපයේම අඳින්න.

(d) සින්ක් වැනි ලෝහයක සමක භාරය නිර්ණය කිරීම සඳහා ඔබ පරීක්ෂණාගාරයේදී සිදු කරන, වායු නියම මත රඳ පවතින පරීක්ෂණයක් විස්තර කරන්න. සියලුම වැදගත් පරීක්ෂණාත්මක විස්තර සහ ගණනයේදී කරන්නා වූ උපකල්පන දෙන්න.

(e) වාතය ඉවත්කළ භාජනයක් තුළ NOBr ග්‍රෑම් 1.10 ක් තබා එහි උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 27 ට ගෙන එන ලදී. එම උෂ්ණත්වයේදී භාජනයේ පරිමාව ඝන ඩෙසිමීටර (ලීටර) 1.0 ක් විය. භාජනයේ අඩංගු සියලුමද වායු අවස්ථාවේ වූ අතර පීඩනය වායුගෝල පීඩන 0.41 ක දී ස්ථායී විය. NOBr විඝටනයෙන් ලැබෙන ඵල NO සහ $Br_2$ වේ නම් සෙන්ටිග්‍රේඩ් අංශක 27 දී එහි විඝටන නියතය, Kp, ගණනය කරන්න. මිශ්‍රණය පරිපූර්ණ වායුවක් සේ හැසිරේ යයි උපකල්පනය කරන්න.

7. (a) i. රසායනික ප්‍රතික්‍රියාවක වේගයට බලපාන සාධක දෙකක් ප්‍රකාශ කරන්න.

ii. එම සාධකවලින් එකක් ප්‍රතික්‍රියා වේගය මත බලපාන අයුරු විදහා දක්වන පරීක්ෂණයක් විස්තර කරන්න.

(b) i. 'සම්මත ඉලෙක්ට්‍රෝඩ විභවය' යනුවෙන් කුමක් අදහස් වේදැයි පහද දෙන්න.

ii. M(ඝ) /$M^+$ (ජලීය, 1.0M)//$H^+$ (ජලීය, 1.0M)/$H_2$ (වායු, වායුගෝ.1 ): Pt කෝෂයේ විද්‍යුත් ගාමක බලය ... V ක් වේ නම් M/$M^+$ පද්ධතියේ සම්මත ඉලෙක්ට්‍රෝඩ විභවය නිර්ණය කරන්න. මෙම කෝෂයේ ඉලෙක්ට්‍රෝඩ ප්‍රතික්‍රියා සහ කෝෂ ප්‍රතික්‍රියාව ලියන්න

iii. විද්‍යුත් රසායනික ශ්‍රේණියේ ප්‍රයෝජන සාකච්ඡා කරන්න.

"ඉ" කොටස - රචනා

8. (a) $MBr_2$ නමැති පොදු ලෝහ බ්‍රෝමයිඩයක, උත්පාදන එන්තැල්පිය සාමාන්‍යයෙන් ඍණ වේ.

$M(ඝ) + Br_2(ද්‍රව) \rightarrow MBr_2(ඝ)$ $\Delta H^\circ < 0$

මෙම ප්‍රතික්‍රියාව සඳහා බෝන් - හේබර් චක්‍රය ලියන්න.

ඉහත ප්‍රතික්‍රියාවේ උත්පාදන එන්තැල්පි විපර්යාසය

(i) M හි ලෝහමය බන්ධන ශක්තිය

(ii) ලෝහයේ අයනීකරණ ශක්තිය

යන සාධක මත කෙසේ රඳ පවතින්නේදැයි පහද දෙන්න.

(b) i. $H_3N:BCl_3$ ii. $CO_3^{2-}$

යන ඒවායේ ව්‍යුහ, තිත්-කතිර සූත්‍ර භාවිතයෙන් ලියන්න.

(c) ඔබට සපයා ඇති මැග්නීසියම් පටි එහි ඔක්සයිඩයට පරිවර්තනය කර, ස්ථිර සමානුපාත නියමය විදහා දක්වන මෙන් ඉල්ලා ඇත. ඔබ එය පරීක්ෂණාගාරයේ දී කෙසේ සිදු කරන්නේදැයි පරීක්ෂණාත්මක විස්තර සහිතව පහදන්න. ගණනයේදී ගන්නා පියවර පහද දෙන්න.

9. (a) පහත දැක්වෙන නිරීක්ෂණ පහද දෙන්න.

i. ඔක්සිජන් පවුලේ මූලද්‍රව්‍යයන්ගේ හයිඩ්‍රයිඩවල ආම්ලිකතාව කාණ්ඩයේ පහළට යන විට වැඩි වේ.

ii. සාමාන්‍ය තත්ත්ව යටතේ පොස්පරස්, නයිට්‍රජන්වලට වඩා ක්‍රියාකාරී මූලද්‍රව්‍යයකි.

(b) i. වායුගෝලීය නයිට්‍රජන්, ඇමෝනියා බවට පරිවර්තනය කිරීමේ හැකියාව විදහා දැක්වෙන, (හේබර් ක්‍රමයට අමතර) රසායනික ක්‍රියාවලියක් විස්තර කරන්න.

ii. Mg, K සහ Ca යන මූලද්‍රව්‍ය ඒවායේ ද්‍රවාංක ආරෝහන ක්‍රමයට සකස් කරන්න. ඔබගේ තේරීම සඳහා හේතු දක්වන්න.

(c) i. $Fe^{2+}$ සහ $Fe^{3+}$ අයන මිශ්‍රණයක ඇති විට, ඒ ඒ අයන ප්‍රමාණාත්මකව නිර්ණය කිරීම පිණිස ඔබ භාවිත කරන එක් ක්‍රමයක් කෙටියෙන් විස්තර කරන්න. (පරීක්ෂණාත්මක විස්තර අනවශ්‍යය.)

ii. නයිට්‍රික් අම්ලයේ වාණිජමය නිෂ්පාදනයට අදළ ප්‍රතික්‍රියා තත්ත්ව දක්වන්න.

10. (a) මුහුදු ජලයෙන් ලුණු සෑදීමේ දී ලැබෙන මවු ද්‍රාවණය රසායනික ද්‍රව්‍යවල වටිනා ප්‍රභවයකි. විද්‍යුත් විච්ඡේදන ක්‍රමයෙන් මුහුදු ජලයෙන් සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් නිපදවීමේ කර්මාන්ත ශාලාවක් සහ කුඩා ප්‍රමාණයේ ඇමෝනියා සෝඩා කර්මාන්තයක් ලුණු ලේවායක් සමීපයේ ඇත. මෙම කර්මාන්ත දෙකෙන් ලැබෙන අතුරුඵල භාවිත කොට මවු ද්‍රාවණයෙන් ආර්ථික වශයෙන් වැදගත් රසායනික ද්‍රව්‍ය නිස්සාරණය කරන්නේ කෙසේදැයි පහද දෙන්න. ඔබේ පිළිතුර කර්මාන්ත දෙකක් උදෙසා විදහා දක්වන්න. ඔබ තෝරාගත් එම කර්මාන්තයන්ගෙන් ලැබෙන සංයෝග සඳහා එක ප්‍රයෝජනය බැගින් දෙන්න.

(b) i. රබර් කිරි කැටි ගැසීමේදී එතනොයික් (ඇසිටික්) අම්ලයේ ක්‍රියාකාරිත්වය පහද දෙන්න. එම ක්‍රියාවලිය සඳහා එතනොයික් අම්ලයට වඩා මෙතනොයික් (ෆෝමික්) අම්ලයේ ඇති වාසි මොනවාද?

ii. පොල් කටු ආරම්භක ද්‍රව්‍යය ලෙස ගෙන සක්‍රිය කළ කාබන් නිපදවන්නේ කෙසේදැයි පහද දෙන්න.

සක්‍රිය කළ කාබන්වල ප්‍රයෝජන දෙකක් දක්වන්න.

(c) X නම් සුදු ස්ඵටික ලවණයක් ත. $H_2SO_4$ සමග රත්කළ විට තෙත් ලිට්මස් පත්‍ර විරංජනය කළේය. X හි ආම්ලික ද්‍රාවණයක් $K_2Cr_2O_7$ ද්‍රාවණයක් සමග ප්‍රතික්‍රියා කරවූ විට තැඹිලි වර්ණය කොළ පාටට හැරුණි. උණුසුම් ත. HCl වල වූ X ද්‍රාවණයක් ඇමෝනියා මගින් භාෂ්මික කර එය තුළින් $H_2S$ යැවූ විට සුදු අවක්ෂේපයක් ලැබුණි. ... ප්‍රතික්‍රියා ... X හි ... අපෝහනය කරන්න

www.sinhalaelibrary.com
Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras